# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 57 දරන
# මධ්‍යම සංස්කෘතික අරමුදල
# පනත

---

**[සහතිකය සටහන් කළේ 1980 දෙසැම්බර් 18 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1980 දෙසැම්බර් මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිළ : ශත 65 යි

තැපැල් ගාස්තුව : ශත 35 යි

# 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත

[සහතිකය සටහන් කළේ 1980 දෙසැම්බර් මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 48/80

**ශ්‍රී ලංකාවේ සංස්කෘතික සහ ආගමික ස්මාරක සංවර්ධනය කිරීම සඳහා ද ශ්‍රී ලංකාවෙහි සහ විදේශයන්හි සංස්කෘතික ස්මාරක සංවර්ධනය කිරීමේ දී, ප්‍රතිසංස්කරණය කිරීමේ දී, ආරක්ෂා කිරීමේ දී සහ ආගමික සහ සංස්කෘතික කටයුතු සංවර්ධනය කිරීමේ දී දරන ලද වියදම් පියවීම පිණිස ද කලාකරුවන්ට, ශිල්පීන්ට, ලේඛකයන්ට, චිත්‍ර ශිල්පීන්ට, සංගීතඥයන්ට සහ සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීමෙහි ලා නිරත වෙනත් තැනැත්තන්ට මුදලින් ආධාර සැලසීම පිණිස ද සංස්කෘතික සහ ආගමික ක්ෂේත්‍රයන්හි ජාතිය වෙනුවෙන් සේවය කළ තැනැත්තන්ට ප්‍රදානයන් කිරීම සඳහා ද අරමුදල් ප්‍රතිපාදනය කිරීම සඳහා "මධ්‍යම සංස්කෘතික අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "මධ්‍යම සංස්කෘතික අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. **මධ්‍යම සංස්කෘතික අරමුදල පිහිටුවීම.**

(2) (1) වන උපවගන්තියෙන් අරමුදලට නියම කර ඇති නාමයෙන් ඒ අරමුදල අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු ය; ඒ නාමයෙන් අරමුදල විසින් නඩු පැවරීම ද අරමුදලට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

(3) අරමුදලේ අරමුණු හා පරමාර්ථ ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුව විසින් කලින් කල අරමුදලට ආධාර මුදල් ප්‍රදානය කළ හැකි ය.

3. (1) අරමුදල පිළිබඳ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට සමන්විත වන පාලක මණ්ඩලයක් වෙත සතු විය යුතු ය. **අරමුදලෙහි පාලක මණ්ඩලය.**

(2) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අරමුදල පිළිබඳ පාලක මණ්ඩලය—

(අ) ඒ මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු අග්‍රාමාත්‍යවරයාගෙන් ;

(ආ) සංස්කෘතික කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගෙන් ;

(ඇ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගෙන් ;

(ඈ) එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධාන විෂයය භාර අමාත්‍යවරයාගෙන් ;

(ඉ) සංචාරක කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගෙන් ;

(ඊ) හින්දු කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගෙන් ;

2—ඒ 51295—10,575 (80/10)

(උ) සංස්කෘතික කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ නියෝජ්‍ය අමාත්‍යවරයකු සිටී නම්, ඒ නියෝජ්‍ය අමාත්‍යවරයාගෙන් ;

(ඌ) අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයාගෙන් ;

(එ) සංස්කෘතික කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ;

(ඒ) පුරාවිද්‍යා කොමසාරිස්වරයාගෙන් ; සහ

(ඔ) අග්‍රාමාත්‍යවරයා විසින් පත්කරනු ලබන්නා වූ ද, අග්‍රාමාත්‍ය වරයා විසින් එක් එක් තැනැත්තා වෙත නිකුත් කරන ලද පත්වීම් ලිපියෙහි සඳහන් කරනු ලබන යම් කාලයක් සඳහා ඒ එක් එක් තැනැත්තා විසින්, (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, ධුරය දැරිය යුතු වූ ද, වෙනත් සාමාජිකයන් දෙදෙනකුගෙන්

සමන්විත විය යුතු ය.

(3) අග්‍රාමාත්‍යවරයා විසින් (2) වන උපවගන්තියේ (ඔ) ඡේදය යටතේ පත් කරනු ලැබූ යම් සාමාජිකයකුගේ පත්වීම අග්‍රාමාත්‍ය වරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

(4) (2) වන උපවගන්තියේ (ඔ) ඡේදය යටතේ පත් කරනු ලැබූ මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් තමා අස්වන බවට වූ ලිපියක් අග්‍රාමාත්‍යවරයා අමතා යැවීමෙන් ඕනෑම අවස්ථාවක දී මණ්ඩල යෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) සභාපතිවරයා හෝ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි විටෙක, පැමිණ සිටින සාමාජිකයන් අතුරින් තෝරා පත්කර ගනු ලැබූ යම් සාමාජිකයකු හෝ ඒ රැස්වීමේ මූලාසනය ගත යුතු ය.

(6) මණ්ඩලයේ රැස්වීමක් සඳහා වූ ගණපූරණය සාමාජිකයන් හතර දෙනකු විය යුතු ය.

(7) (6) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ රැස්වීම් පිළිබඳ කාර්ය පටිපාටිය ද ඒ රැස්වීම්වල කටයුතු ද මණ්ඩලය විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

(8) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි යම් සාමාජිකයකු පත්කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හෝ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වෙතැයි සලකනු නොලැබිය යුතු ය.

අරමුදලේ බලතල.

4. මණ්ඩලයට, අරමුදලේ නාමයෙන්—

(අ) දේශීය වූ හෝ විදේශීය වූ හෝ ප්‍රභවයන්ගෙන් මුදලින් හෝ ද්‍රව්‍යවලින් ලැබෙන ප්‍රදාන, තෑගි හෝ පරිත්‍යාග භාර ගැනීමට ;

(ආ) මේ පනතින් හෝ යම් මිල දී ගැනීමක්, ප්‍රදානයක්, තෑග්ගක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් අරමුදල වෙත සතු කරනු ලබන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් භාරගැනීමට හෝ දැරීමට සහ අරමුදල

විසින් හිමිකම ලබන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් විකිණීමට, උකස් කිරීමට, බද්දීමට, ප්‍රදානය කිරීමට, සමර්පණය කිරීමට, රික්ථවරණය කිරීමට, පවරා දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට ;

(ඇ) අරමුදලේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ආධාර මුදල්, පරිත්‍යාග මුදල් හෝ ශිෂ්‍යත්ව දීමට ;

(ඈ) අරමුදල සතු බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා ද අරමුදලේ පරමාර්ථ ක්‍රියාවේ යෙදවීම සඳහා ද අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හා එකඟවීම්වලට කෙලින් ම හෝ මණ්ඩලය විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය දෙනු ලැබූ නිලධරයන් සහ සේවකයන් මගින් හෝ අනුයෝජිතයන් මගින් හෝ එළඹීමට හෝ එම ගිවිසුම් හෝ එකඟවීම් ඉටුකිරීමට ;

(ඉ) මේ පනතේ විධිවිධානවලට යටත්ව, අරමුදලේ නිලධරයන් හා සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට හා ඔවුන්ගේ පාරිශ්‍රමික ගෙවීමට ද, ස්වකීය සේවා නියුක්තයන් පත් කිරීම, උසස් කිරීම, ඔවුන්ගේ පාරිශ්‍රමික ගෙවීම, ඔවුන්ගේ විනය පාලනය කිරීම හා ඔවුන්ට නිවාඩු දීම හා වෙනත් ප්‍රතිලාභ දීම ද පිළිබඳ රීති සෑදීමට ;

(ඊ) අරමුදලට අයත් වන්නාවූ මුදල්, මණ්ඩලයේ අභිමතය පරිදි ආයෝජනය කිරීමට සහ ඒ ආයෝජන ආපසු ලබා ගැනීමට, නැවත ආයෝජනය කිරීමට හා වෙනස් කිරීමට සහ ඒ ආයෝජනවලින් උපචිත වන ආදායම් ලබා ගැනීමට ;

(උ) අරමුදලේ ක්‍රියාකාරිත්වය හා සම්බන්ධ සියලු කාරණාවලට අදාළ රීති සෑදීමට

බලය තිබිය යුතු ය.

අරමුදලට මුදල් පැවරීම.

5. මේ පනත ආරම්භ වන දින සිට—

(1) "ඇපොලෝ සර්කස් ගිණුමේ" ;

(2) "කපිලවස්තු ගිණුමේ" ;

(3) "දුටු ගැමුණු හෂ්මාවශේෂ ගිණුමේ" ;

(4) "සංස්කෘතික ත්‍රිකෝණය ගිණුමේ" ; සහ

(5) "රජයේ සේවකයන්ගෙන් ලැබුණු දායක මුදල් ගිණුමේ" බැරට ඇති සියලු මුදල්, අරමුදලට පවරනු ලැබිය යුතු ය.

මධ්‍යම සංස්කෘතික අරමුදල් ගිණුම.

6. මණ්ඩලය විසින් "මධ්‍යම සංස්කෘතික අරමුදල් ගිණුම" යනුවෙන් හඳුන්වනු ලබන ගිණුමක් ලංකා බැංකුවෙහි පවත්වා ගෙන යා යුතු අතර, ඒ ගිණුමට—

(අ) 2 වන වගන්තිය යටතේ ආණ්ඩුවෙන් ලැබුණු යම් ආධාර මුදලක් ;

(ආ) 5 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර අරමුදලට පවරනු ලබන සියලු මුදල් ;

(ඇ) අරමුදලට මුදලින් කරනු ලබන යම් තෑගි හෝ පරිත්‍යාග ;

(ඈ) ආයෝජනවලින් ලබන යම් ආදායමක් හෝ අරමුදලට ලැබිය යුතු වෙනත් ලැබීම් ;

(ඉ) මෙහි උපලේඛනයෙහි දක්වා ඇති සැලැස්මෙහි නිරූපණය කරනු ලැබ ඇති (මෙහි මින් මතු "සංස්කෘතික ත්‍රිකෝණය" වශයෙන් හඳුන්වනු ලබන) ප්‍රදේශයට ඇතුළු වන ආගන්තුකයන්ගෙන් සහ සංචාරකයන්ගෙන් අය කරනු ලබන ගාස්තුවලින් ව්‍යුත්පන්න වන යම් ආදායමක් ; සහ

(ඊ) මේ පනත ආරම්භ වන දිනයට පසු අරමුදලට උපචිත වන සියලු මුදල්

බැර කරනු ලැබිය යුතු ය.

අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධරයා.

7. සංස්කෘතික කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා, මණ්ඩලයේ විධානයට යටත්ව, අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධරයා විය යුතු ය.

අරමුදලේ මුදල් යොදවනු ලැබිය හැකි පරමාර්ථ.

8. අරමුදලට අයත් මුදල් ප්‍රධාන වශයෙන් ම පහත දැක්වෙන පරමාර්ථ සඳහා හෝ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන වෙනත් ආකාරයකට හෝ යෙදවීම මණ්ඩලයේ කාර්යය විය යුතු ය :—

(අ) සංස්කෘතික ත්‍රිකෝණය තුළ ඇති සංස්කෘතික ස්මාරක සහ, සංස්කෘතික ත්‍රිකෝණය හැර වෙනත් යම් ප්‍රදේශයක ඇත්තාවූ ද මහජන යහපත සඳහා දියුණු කිරීම අවශ්‍ය බව මණ්ඩලය විසින් අදහස් කරනු ලබන්නා වූ ද වෙනත් යම් සංස්කෘතික ස්මාරක සංවර්ධනය කිරීමේ දී දරන ලද සියලු වියදම් පියවීමට ;

(ආ) ජේතවන දාගැබ යෝජනා ක්‍රමයෙහි සහ වෙනත් ඒ සමාන යෝජනා ක්‍රමයන්හි සියලු වියදම් පියවීමට ;

(ඇ) ශ්‍රී ලංකාව ඇතුළත හෝ විදේශයන්හි ආගමික කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා ;

(ඈ) ආගම නංවාලීම සඳහා හෝ ආගමික ස්ථාන හා ආගමික වත් පිළිවෙත් පවත්වා ගෙන යාම සඳහා ;

(ඉ) සංස්කෘතික සහ ආගමික ක්ෂේත්‍රයන්හි ලා ජාතියට සේවය කර ඇත්තා වූ තැනැත්තන්ට ප්‍රදානයන් පිරිනැමීම සඳහා ;

(ඊ) කලාකරුවන්ට, ලේඛකයන්ට, චිත්‍ර ශිල්පීන්ට, සංගීතඥයන්ට, මූර්ති ශිල්පීන්ට සහ සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීමෙහි ලා නිරත වෙනත් තැනැත්තන්ට මුදලින් ආධාර සැලසීම සඳහා ; සහ

(උ) මණ්ඩලයේ මතය අනුව, මහජනයාට ප්‍රතිලාභයක් හෝ යහපතක් සැලසෙන වෙනත් යම් ආගමික හෝ සංස්කෘතික කාර්යයක් සඳහා.

ගිණුම් සහ විගණනය.

9. (1) අරමුදලේ ආදායම සහ වියදම සහ වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් මණ්ඩලය විසින් නිසි ගිණුම් පොත් තැබීමට සැලැස්විය යුතු ය.

(2) විගණකාධිපතිවරයා විසින් සෑම වර්ෂයක දී ම අරමුදලේ ගිණුම් විගණනය කරනු ලැබිය යුතු ය. ඒ ගිණුම් විගණනය කිරීමේ දී තමාට සහාය වීමේ කාර්යය සඳහා විගණකාධිපතිවරයා විසින් සුදුසුකම් ලත් යම් විගණකවරයකු සේවයෙහි නියුක්ත කරනු ලැබිය හැකි අතර, ඒ විගණකවරයා විසින් විගණකාධිපතිවරයාගේ විධානය සහ පාලනය යටතේ ක්‍රියා කළ යුතු ය.

(3) අරමුදලේ ගිණුම් විගණනය කිරීමෙහි ලා විගණකාධිපතිවරයා විසින් දරන ලද වියදම් පියවීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් අරමුදලේ ආදායමෙන් විගණකාධිපතිවරයාට ගෙවනු ලැබිය යුතු ය. විගණකාධිපතිවරයාට අරමුදලෙන් ලැබෙන යම් පාරිශ්‍රමිකයකින් ඒ විගණනයේ කාර්යය සඳහා ඔහු විසින් සේවයෙහි නියුක්ත කරගන්නා ලද යම් සුදුසුකම් ලත් විගණකවරයකුට හෝ විගණකවරයන්ට හෝ, ඔහු විසින් ගෙවන ලද යම් මුදලක් අඩුකර ගැනීමෙන් පසුව, ඒ පාරිශ්‍රමිකයේ ශේෂය ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලය විසින් වාර්ෂිකව, අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම පිළිබඳව වූ වාර්තාවක් සහ සම්පූර්ණ වූ වර්ෂය ඇතුළත මුදල් කටයුතු පිළිබඳව වූ වාර්තාවක් පිළියෙල කළ යුතු අතර ඒ මුදල් කටයුතු පිළිබඳ වාර්තාව යම් වර්ෂයකට අදාළ වන්නේ ද, ඒ වර්ෂයට ඉක්බිතිව ම වූ වර්ෂයේ අවසානයට පෙර, එම වාර්තා, විගණකාධිපතිවරයාගේ වාර්තාවත් සමඟ, පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීම සහ මහජනයාගේ දැනගැනීම සඳහා ගැසට් පත්‍රයේ පළ කිරීම කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියෙහි "සුදුසුකම් ලත් විගණකවරයා" යන යෙදුමෙන්—

(අ) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරිවරයන්ගේ සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි ගණකාධිකාරිවරයන්ගේ සමාගමක් හෝ අදහස් වේ.

අරමුදලේ මුදල් වර්ෂය.

10. අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

ඇතැම් තීරු බදුවලින් සහ බදුවලින් අරමුදල නිදහස් කිරීම.

11. (1) යම් භාණ්ඩ ආනයනය කිරීම අරමුදලෙහි පරමාර්ථ හා අරමුණු ඉටුකිරීම සඳහා හිතකර යයි සලකනු ලැබේ නම්, සංස්කෘතික කටයුතු භාර අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අරමුදල විසින් ආනයනය කරනු ලබන ඒ භාණ්ඩ වෙනුවෙන් යම් රේගු බද්දක් ගෙවීමෙන් අරමුදල නිදහස් කළ හැකි ය.

(2) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ ගෙවිය යුතු යම් ආදායම් බද්දකින් හෝ ධන බද්දකින් අරමුදල නිදහස් විය යුතු ය.

(3) යම් තැනැත්තකු විසින් අරමුදලට තෑග්ගක් පිරිනමන අවස්ථාවක, එම තෑග්ගේ මුළු වටිනාකමේ ප්‍රමාණයට, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත යටතේ තෑගි බද්ද ගෙවීමෙන් ඒ තැනැත්තා නිදහස් විය යුතු ය.

(4) යම් තැනැත්තකු විසින් අරමුදලට පරිත්‍යාගයක් කරන අවස්ථාවක, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ කාර්ය සඳහා එම පරිත්‍යාගය අනුමත වියදමක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පරිත්‍යාගයේ මුළු වටිනාකම වෙනුවෙන් ඒ පනත යටතේ සහනය ලැබීමට ඒ ත්‍යාගදායකයා හිමිකම් ලැබිය යුතු ය.

(5) අවස්ථාවෝචිත පරිදි, විනෝද බදු ආඥාපනත යටතේ විනෝද බදු ගෙවීමෙන් ද, මහ නගර සභා ආඥාපනත, නගර සභා ආඥාපනත, සුළු නගර සභා ආඥාපනත හෝ ගම් සභා ආඥාපනත යටතේ වෙනත් බදු සහ වරිපනම් ගෙවීමෙන් ද අරමුදල නිදහස් විය යුතු ය.

(6) අවස්ථාවෝචිත පරිදි, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතෙහි සහ මහ නගර සභා ආඥාපනතෙහි, නගර සභා ආඥාපනතෙහි, සුළු නගර සභා ආඥාපනතෙහි හෝ ගම් සභා ආඥාපනතෙහි පට හැනිව කුමක් සඳහන්ව ඇත ද මේ වගන්තියෙහි විධිවිධාන බල පැවැත්විය යුතු ය.


අරමුදලේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

12. (1) මණ්ඩලයේ ඉල්ලීම පිට, රජයේ සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ ද රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍ය වරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනි ම කැමැත්ත ඇතිව තීරණය කරනු ලබන කාල පරිච්ඡේදයක් සඳහා අරමුදලේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කිරීම හෝ එවැනි ම කැමැත්ත ඇතිව, ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කිරීම කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු අරමුදලේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු අරමුදලේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ

උපලේඛනය


සංස්කෘතික ත්‍රිකෝණය
கலாசார முக்கோணம்
CULTURAL TRIANGLE
අනුරාධපුරය
அனுராதபுரம்
ANURADHAPURA
පොළොන්නරුව
பொலொன்னறுவை
POLONNARUWA
මහනුවර
கண்டி
KANDY

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොඇපසීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.